# මූල්‍ය ප්‍රකාශන විගණනයේදී වංචා පිළිබඳ සලකා බැලීමේ විගණකගේ වගකීම (SLAuS 240)

ජීවන්ත පෙරේරා

ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

# මූල්‍ය ප්‍රකාශන විගණනයේදී වංචා පිළිබඳ සලකා බැලීමේ විගණකගේ වගකීම. (SLAuS 240)

- හැඳින්වීම
- වංචා හා වැරදි යනු කුමක්ද?
- කළමනාකාරිත්වයේ වගකීම
- විගණකවරයාගේ වගකීම
- අතිරේක අවධාරනයන්
    - වැරදි හා වංචා සඳහා ඉඩ සලසන සාධක
    - වාර්තාකාරණය


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## හැඳින්වීම

විගණන අවධානම පිළිගත හැකි මට්ටමකට අඩු කර ගැනීම සඳහා විගණනයක් සැලසුම් කිරීමේදී, ක්‍රියාත්මක කිරීමේදී හා වාර්තා කිරීමේදී, වංචා නිසා මූල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණාත්මක සාවද්‍යතාවයක් ඇතිවීමේ අවධානම පිළිබඳව විගණක සලකා බැලිය යුතු වේ. මෙම නිසා සමස්ථ විගණන ක්‍රියාවලිය පුරාවටම වැරදි හා වංචා ඇතිවීමේ අවදානම පිළිබඳව විගණක නිරන්තර අවදියෙන් සිටිය යුතු වේ.

## වැරදි හා වංචා යනු කුමක්ද?

"කළමනාකරණ කණ්ඩායම්, යහපාලනය සම්බන්ධයෙන් වගකීම දරන පාර්ශවයන්, සේවක පිරිස්, තෙවන පාර්ශවයන් අසාධාරන හෝ නීති විරෝධී වාසි ලබා ගැනීම සඳහා හිතා මතා සිදු කරන ක්‍රියාවක් වංචාවක් ලෙස හදුන්වයි."

මේ අනුව වංචාවක් යනු ඉතා පුළුල් පරාසයකට විහිදී යන සංකල්පයක් වේ. නමුත්, මෙහිදී අප සලකා බලනු ලබන්නේ මූල්‍ය ප්‍රකාශනයක් තුල ප්‍රමාණාත්මක සාවද්‍යතාවයක් ඇති වීම කෙරෙහි බලපාන වංචාවන් පිළිබඳවයි. මේ අනුව වංචාවක් ප්‍රධාන ස්වරූපයන් 2 ක් යටතේ අධ්‍යනය කළ හැකිය.

1. **වත්කම් අයථා භාවිතය**
   **උදාහරණ**- මුදල් ලැබීම් වංචා කිරීම- ආයතනයේ වත්කම් තම පුද්ගලික ප්‍රයෝජනයට භාවිතා කිරීම.

2. **වංචනික මූල්‍ය වාර්තාකරණය**
   මූල්‍ය වාර්තා භාවිතා කරන්නන් නොමඟ යැවීම සඳහා හිතාමතා සිදු කරන සාවද්‍යතාවයන් මින් අදහස් වේ.
   උදාහරණ- හරයක් රහිතව ගණුදෙණු සටහන් කිරීම, ගණුදෙණු වල බලපෑම සැඟවීම හෝ ඉවත් කිරීම.

"හිතාමතා නොවන ආකාරයට මූල්‍ය ප්‍රකාශණ කට්ටලයක් තුල පවතින සාවද්‍ය ප්‍රකාශන වැරදි ලෙස හදුන්වයි."

උදාහරණ - අංක ගණිතමය හා ලිපිකාරමය දෝෂ
එකම ගණුදෙනුව දෙවතාවක් ගිණුම් ගත වීම.

## වංචා හා වැරදි පිළිබඳව කළමනාකරණය හා වගකීම දරන පාර්ශවයන්ගේ වගකීම.

ව්‍යාපාරයක් තුල සිදුවිය හැකි වැරදි හා වංචා වළක්වා ගැනීමත් සිදු වී ඇති වැරදි හා වංචා හෙළිදරව් කර ගැනීමක් ව්‍යාපාරයේ කළමනාකාරිත්වය සතු වගකීමක් වේ. මේ සඳහා කළමනාකාරිත්වය,

1. සඵලාදායි ගිණුම්කරණ හා අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යාපාරය තුල ස්ථාපිත කළ යුතු වේ.
2. මනා පාලන පරිසරයක් හා මනා පාලන ක්‍රියාකාරකම් ව්‍යාපාරය තුල ස්ථාපිත කල යුතු වේ.

## <u>අතිරේක සටහන්</u>

**මනා පාලන පරිසරය හා පාලන ක්‍රියාකාරකම් යනු කුමක්ද?**


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

**වංචා හේතුවෙන් පැන නගින ප්‍රමාණාත්මක සාවද්‍යතාවයන් අනාවරණය කර ගැනීමේ විගණකගේ වගකීම.**

මෙහිදී සමස්ථ විගණන ක්‍රියාවලිය පුරාවටම වංචා නිසා මූල්‍ය වාර්තා කට්ටලය තුල ප්‍රමාණාත්මක සාවද්‍යතාවයන් ඇතිවීමේ අවධානම පිළිබඳව නිරන්තර අවදියෙන් විගණක සිටිය යුතු වේ. මෙහිදී විගණක වෘත්තීමය විමර්ශණතාවය පවත්වා ගත යුතු වේ. මෙහිදි විශේෂයෙන්ම,

a) විගණක තම විගණක කණ්ඩායමේ සාමාජිකයන් සමඟ වැරදි හා වංචා ඇති වීමේ අවධානම පිළිබඳව නිරන්තරයෙන් සාකච්ඡා කිරීම සිදු කළ යුතු වේ.

b) වැරදි හා වංචා නිසා මූල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණාත්මක සාවද්‍යතාවයක් ඇතිවීමේ අවධානම පිළිබඳව තක්සේරු කිරීමක් සිදු කළ යුතු වේ. මෙහිදි විශේෂයෙන්ම වැරදි හා වංචා ඇතිවීම සඳහා ඉඩ සලසන,

- **අවස්ථාවන්**

- **සේවක ආකල්ප**


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

- **දිරිදීම් හා පීඩනයන් පිළිබඳව සලකා බැලිය යුතුය.**

c) සිදු වී ඇති හා හෙළිදරව් වී ඇති වැරදි හා වංචා පිළිබඳව හා ඒවා අනාගතයේ ඇතිවීම වැලැක්වීමට කළමනාකරණය ගෙන ඇති පියවර පිළිබඳව කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා කිරීම. තවද ව්‍යාපාරය තුල අභ්‍යන්තර විගණක කාර්යයක් සිදුවේ නම්, ඒ පිළිබඳව වගකීම දරන පාර්ශවයන් සමඟ සාකච්ඡා කළ යුතුයි.

d) වරදක් හෝ වංචාවක් පිළිබඳ හෝඩුවාවක් ලද විට,

- එහි ස්වරූපය
- එය සත්‍ය වශයෙන්ම ඇති වීමට ඇති ඉඩ ප්‍රස්ථාව
- එය මූල්‍ය වාර්තාවලට ඇති කරන බලපෑම සලකා බැලිය යුතු වේ.

## අතිරේක අවධාරණයන්

වැරදි හා වංචා සඳහා ඉඩ සලසන සාධක.

a) අභ්‍යන්තර පාලන පද්ධතීන්වල දුර්වලතාවයන් පැවතීම.

b) කළමනාකාරිත්ව අවංකභාවය හා ප්‍රවීණත්වය පිළිබඳව ගැටලු.

c) ව්‍යාපාරය තුල හා ඉන් පරිබාහිරව ඇතිවන අසාමාන්‍ය පීඩනයන්.

## වාර්තාකරණය

විගණක විසින් වංචාවක් /වරදක් සත්‍යවශයෙන් සිදු වී ඇති බව සොයාගත් විටදි හෝ ඒ පිළිබදව හෝඩුවාවක් ලද විට හැකි ඉක්මනින් ව්‍යාපාරයේ කළමනාකාරිත්වය/යහපාලනය පිළිබදව වගකිම දරන පාර්ශවයන් දැනුවත් කළ යුතුවේ. බාහිර පාර්ශවයකට දැනුවත් කිරීමේදී රහස්‍යභාවය පිළිබදව සැලකිලිමත් විය යුතුය.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd